www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ස්ථානයේ සිට වාර්තා කරයි

# දරිද්‍රතාවයේ ගිලුනු හම්බන්තොට ශ්‍රී ලංකාවේ වඩාත් විපතට පත් ප්‍රදේශවලින් එකකි

*on-the-spot report*

**Poverty-stricken Hambantota among the worst affected areas in Sri Lanka**

**අපගේ වාර්තාකරුවන් විසිනි**
**2004 දෙසැම්බර් 31**

ශ්‍රී ලංකා දිවයිනේ දකුනේ පිහිටි හම්බන්තොට දිස්ත්‍රික්කය දෙසැම්බර් 26 වන දින සුනාමි සැඩ පහරින් ඉමහත් ව්‍යසනයට පත් ප්‍රදේශවලින් එකකි. මෙහි පහත් මුහුදුබඩ තීරුව ප්‍රචන්ඩ මුහුදු ගොඩ ගැලීමට හසු වූ අවස්ථාවේ සිදුවූ මරන සංඛ්‍යාව දැනට පවතින නිල වාර්තාවලට අනුව 4,500ක් වුවද දිවි ගලවා ගත් අය පවසන්නේ මෙය බරපතල අවතක්සේරුවක් බව ය. ඇත්ත වසයෙන්ම අහිමි වූ ජීවිත සංඛ්‍යාව කිසිවෙකුට කෙදිනක වත් දැනගත නො හැකි බවයි.

ශ්‍රී ලංකාවේ අගනුවර වන කොලඹට කිලෝමීටර් 240ක් දකුනෙහි හම්බන්තොට දිස්ත්‍රික්කය පිහිටා ඇත. රටේ දරිද්‍ර ම සහ දුරස්ථ ම පලාත්වලින් එකක් වන මෙහි ජනගහනයෙන් වැඩි කොටස, ධීවර කටයුතු, කුඩා පරිමාන කෘෂිකාර්මික කටයුතු, ලුනු නිෂ්පාදනය සහ සංචාරක ව්‍යාපාර කටයුතු ආධාරයෙන් එදිනෙදා ජීවිකාවන් පවත්වා ගෙන යයි. ලංකාවේ වනෝද්‍යාන අතරින් විශාලත්වයෙන් දෙවන තැන ගන්නා යාල ජාතික වනෝද්‍යානයට යාබදව පිහිටි මෙම ප්‍රදේශය සෑම වසරකම දහස් ගනන් සංචාරකයින් ආකර්ශනය කර ගනී.

එම ප්‍රදේශයේ ස්වාභාවික සුන්දරත්වය සංචාරකයන්ගේ සිත් ඇද ගත්ත ද ජල හිඟය එම ප්‍රදේශයට නිරන්තරව ම හානිකර වී ඇත. ප්‍රදේශයේ 533,000ක් තරම් වන ජනගහනයෙන් තුනෙන් එකක් ජීවත්වන්නේ දරිද්‍රතා රේඛාවට පහලිනි. පවුල්වලින් 26.3%ක් දුප්පතුන් බව නිල වසයෙන් වර්ගීකරනය කොට ඇත. තරුන විරැකියාව බහුලව පැතිර පවතී. අතිශයින්ම ප්‍රදේශයට ම ආවේනික දරිද්‍රතාවය හේතුවෙන් මෙම දිස්ත්‍රික්කය සිය දිවි නසා ගැනීමේ ඉහල ප්‍රතිශතයක් වාර්තා කරයි.

සුනාමි ප්‍රහාරයේ අති මහත් විනාශකාරී බලපෑම මගින් ප්‍රදේශයේ ජනතාව වඩ වඩා අගාධයට ඇද දමා ඇත. සුනු විසුනු වී ගිය නිවාස හා වාසස්ථාන, උඩුකුරු වූ රථවාහන, මුලින් ඉදිරී ගිය දුරකථන කනු, යාබද වගුරු සහිත කඩලානවල සහ කලපුවල පාවෙමින් තිබෙන අසංඛ්‍යේය මල සිරුරු හේතුවෙන් හම්බන්තොට යුද පිටියක් සේ දිස්වේ.

ලෝසවෙඅ වාර්තාකරුවන්ට ප්‍රදේශයට ලඟාවීමේ දී මුහුන පෑමට සිදුවූ දුෂ්කරතාවයන් මත්, ශ්‍රී ලංකාවේ දකුනේ සිදු වූ මෙම විනාශයේ ප්‍රමානය පැහැදිලි කරයි. මුහුදු බඩ දුම්රිය මාර්ගය ද, කොලඹ ගාල්ල හා මාතර අතර මුහුදු බඩ මහා මාර්ගයේ විශාල කොටසක් ද විනාශයට ගොදුරු වී ඇති බැවින් අපට යතුරු පැදියෙන් ප්‍රධාන මාර්ගයෙන් ඉවත්ව අතුරු පාරවල් දිගේ හම්බන්තොටට ලඟාවීමට සිදු විය.

මුහුද ගොඩ ගැලීමට පෙර හම්බන්තොටට යෑමට ගත වන්නේ පැය 4ක පමන කාලයකි. එහෙත් අපගේ ගමනට දින දෙකක් ගත විය. අඟහරුවාදා උදෙන්ම ගමන් ඇරඹූ අප සිය ගනන් විනාශ වූ නිවාස, ඇඹරී ගිය දුම්රිය මාර්ග හා අවහිර වූ මාර්ග පසු කරමින් ගමන් කලෙමු. එක ස්ථානයක දුම්රිය මාර්ගය සම්පූර්නයෙන් විනාශ වී තිබුනු අතර ඉන් මීටර 200ක් පමන ඔබ්බෙන් ඇද වී පෙරලී උඩුකුරුවී ගිය දුම්රිය මැදිරි කීපයක් දර්ශනය විය. ඒවා තුල සිරවී මිය ගිය අයගේ මරනයේ භයංකරත්වය යමෙකුට උපකල්පනය කිරීමට පමනක් පිලිවන.

ගාල්ලට ලඟාවීමට නොහැකි වූ අපට තව දුරටත් ගොඩකරයට ගොස් අතුරු පාරවල් රාශියක් දිගේ දකුනු වෙරල බඩ පිහිටි මාතරට ලඟාවීමට හැකි විය. දවසේ වැඩි කොටස ගත වූයේ ගමනට ය. බරපතල ඉන්ධන හිඟයක් පැවති අතර ඉන්ධන සැපයීම පිරිහෙමින් තිබුනු තත්වය තුල ඉන්ධන කිසියම් ප්‍රමානයක් ඉතිරිව තිබුනු ඉන්ධන හල් ඉදිරිපිට ඉන්ධන ස්වල්පයක් හෝ ලබා ගැනීමට පෝලිම් ගැසී සිටි සිය ගනන් ජනයා දක්නට ලැබිනි.

හම්බන්තොට මාතර සිට කිලෝමීටර් 80ක් පමන දුරින් පිහිටියත් පසු දින එහි ලඟාවීමට අපට පැය කීපයක් ගත විය. බදාදා සවස එහි ලඟාවූ විට අපට දැක ගත හැකි වුනේ වචනවලින් විස්තර කල නොහැකි අති මහත් ව්‍යසනයක දර්ශනයකි.

නගරයෙන් ඉතිරිවී තිබුනු කොටසට ජලය, විදුලිය හෝ දුරකථන පහසුව නැත. බස් රථ 17ක් ද බස් නැවතුම් පොල සහ අවට ගොඩනැගිලි ද

සම්පූර්නයෙන් විනාශ වී තිබුනි. හම්බන්තොට තිස්ස මාර්ගයේ නිවාස 1,000ක් පමන ද නගර සභා නිවාස ද සාප්පු සහ වෙනත් ගොඩනැගිලි ද සහමුලින්ම විනාශ වී ඇත. බොහෝ නිවාසවල පවුල් දෙකක් හෝ තුනක් ජීවත්ව සිට ඇත. හම්බන්තොට වරාය අසල ජීවත්වූ විශාල මුස්ලිම් ජන කොටස සහමුලින්ම මුහුදට ගසා ගෙන ගොසිනි. සුනාමි රල පහර කොතරම් චන්ඩ වී ද යත් කිලෝ මීටරයක් පමන ගොඩකරයට පිහිටි නිවාස පවා විනාශ වී ඇත.

කොලඹට පැමිනෙන ප්‍රධාන මාර්ගය සහ නගරයට ආසන්න අතුරු පාරවල් සම්පූර්නයෙන් ම ගමන්කල නොහැකි තත්වයට පත්වී තිබුනි. තම නෑදෑ හිත මිතුරන් සොයමින් ප්‍රදේශය පීරමින් රැස්කකා සිටි සිය ගනන් ජනයාගෙන් එකී මාර්ග තදබද විය.

සහකාර ප්‍රාදේශීය ලේකම්වරයෙකු මේ සතියේ ප්‍රකාශ කර සිටියේ හමුදා නිලධාරීන් 500ක් මල සිරුරු සෙවීමේ කටයුතුවල නිරතව ඇති බවත් මල සිරුරු 2,000ක් සොයාගෙන ඇති බවත් ය. නැගෙනහිර පලාතේ මුලතිව් සහ අම්පාර දිස්ත්‍රික්ක හැරුනු විට ශ්‍රී ලංකාවේ විශාලතම මරන සංඛ්‍යාවක් වාර්තා වූ දිස්ත්‍රික්කය හම්බන්තොට යි. දැනට මත් දහස් ගනන් මල සිරුරු සමූහ මිනීවලවල්වල මිහිදන් කොට ඇත.

මින් පසු අපට කරගත් ලුනු ලේවාය අසල මල සිරුරු පුරවා ගත් ට්‍රක් රථ 12ක් දැක ගත හැකි වූ අතර එකී මල සිරුරු සමහරක ඡායා රූප ගැනීමට අප උත්සාහ කල ද පොලිස් නිලධාරියෙක් අපට එයට ඉඩ නොදුනි. ඔහු නියෝග කලේ පොලිස් අධිකාරිවරයාගෙන් පූර්ව අවසරයක් නැතිව ඡායා රූප ගැනීමට නොහැකි බව ඔහු ප්‍රකාශ කලේ ය. අප පොලිස් අධිකාරිවරයා හමු වූ අවස්ථාවේ ඔහුගේ ප්‍රතිචාරය වුනේ ''පලමුවෙන් මිනී ගැනීමට අපට උදව් කරන්න එවිට ඡායා රූප කීපයක් ගැනීමට පුලුවන්'' යන්නයි.

සුනාමි මුහුද ගොඩගැලීම සිදු වූ අවස්ථාවේ සිය ගනන් වැසියන් මාතර සහ හම්බන්තොට ඉරුදින පොලවලටත් වෙනත් ඊට ආසන්න නගරවල වෙලඳ පොලවල්වල ද සිට ඇත. රල පහර ගැසූ අවස්ථාවේ ඇත්තටම තක්සේරු කර ඇති පරිදි දෙදහසක් හෝ තුන් දහසක් පමන පුද්ගලයින් හම්බන්තොට වරාය අසලින් ගමන් කරමින් සිට ඇත. මොවුන්ගෙන් වැඩි දෙනා මිය ගොසිනි.

අප ආර්. වසන්ත සමග කතා කල අතර ඔහු තමාගේ සිත් කම්පා කරන අත්දැකීම් විස්තර කලේ මෙසේ ය. ''මම නගරයේ බස් නැවතුම්පලේ උඩුමහලේ සිටියා. උදෑසන 9.30ට විතර විශාල රල පහරක් පැමින එය වෙරලේ විශාල කොටසක් විවෘත කරමින් ආපස්සට ඇදී ගියා. ඉන් මිනිත්තු 5කට පමන පසු තවත් රල පහරක් පැමිනියා.

එම ජලකඳ ආපසු බැසගිය අවස්ථාවේ බස් නැවතුම් පොලේ සිටි මිනිසුන් ද සමග ගොඩනැගිලි, වාහන, ත්‍රිරෝද රථ, බස් රථ ද ඇතුලු සියල්ල කිසිදු සලකුනක් ඉතිරි නොකොට මුහුදට ඇද ගත්තා. එය විශ්වාස කල නොහැකි අති භයංකර දර්ශනයක්''.

හම්බන්තොට සූරිය වැව පන්සලේ අවතැන් වූවෝ 150ක් රැකවරනය ලබති. අප සමග කතා කල සියලු දෙනාම රජයෙන් මෙන් ම කිසිම ආධාරයක් නො ලැබුනු බවට චෝදනා කලහ. වග කිවයුතු ඇමතිවරයෙක්, මන්ත්‍රීවරයෙක්, හෝ නිලධාරියෙක් තමන්ගේ තත්වය ගැන සොයා බැලීමට නො පැමිනි බවටත් තමන්ට කිසිම රජයේ ආධාරයක් නො ලැබුනු බවටත් ඔවුහු චෝදනා කලහ. තමන්ට ලැබුනු ඇඳුම් සහ ආහාර ඒ සියල්ල ස්වෙච්ඡා සංවිධානවලින් මිස රජයෙන් නොවන බව විපතින් දිවි ගලවා ගත් අය ප්‍රකාශ කලහ. මෙම ආධාර මත තව කොතරම් කල් ජීවත්විය හැකි දැයි ඔවුහු ප්‍රශ්න කලහ.

කඳවුරේ සිටි තරුනයින් පිරිසක් තම බලාපොරොත්තු සුන් වූ තත්වය විස්තර කලේ මෙසේ යි. ''අපි ජීවත්වුනේ නගරයේ දිනපතා සුලු වෙලඳාමක් කරල. ඒකත් අපිට ලොකු සටනක්. ඒත් දැන් අපි මොකද කරන්නෙ? මිනිස්සුන්ට සල්ලි නැහැ. අවුරුද්දකට කලින් අපට ඇඩ් නියඟයක් තිබුනා. ඊලඟට ගංවතුරක් ආව. දැන් මුහුද ගොඩ ගලනව. අපට තිබුනු සියල්ල නැතිවුනා. අප මාලු ඇල්ලීම කලා, ඒකටත් දැන් උපකරන කිසිවක් ඉතිරිවෙලා නැහැ. දැන් කොහොමද අපි ජීවිතය ගැටගහගන්නෙ''

හම්බන්තොටින් කිලෝමීටර් 40ක් නැගෙනහිරට පිහිටි තංගල්ලේ ඔරුගොඩැල්ලේ කේ. ජානක අපට මෙලෙස පැවසී ය. ''මන්ත්‍රීවරු මැතිවරනවල දී නිතරම එනව. නමුත් ඔවුන් තවමත් අපව මුන ගැහිලා අපට අවශ්‍ය මොනවද කියල බලන්න වත් හිතල නැහැ. අපට මාධ්‍යවලින් ඇහෙනව විදේශ ආධාර විශාල වසයෙන් ලැබෙන බව. නමුත් අපට නම් ඒ කිසි දෙයක් ලැබිල නැහැ.''

තංගල්ල ධීවර වරායේ ගැහැනු ලමයෙක් බලධාරින් සුනාමි රල පහර ගැන දැන ගෙන නො සිටි බව විශ්වාස කල නොහැකි බව පැවසී ය. එමෙන්ම බලධාරීන් අපට අනතුරු ඇඟවූයේ නැත්තේ ඇයි දැයි ඇය ප්‍රශ්න කලා ය. ''ආන්ඩුවෙන් හෝ වගකිවයුතු බලධාරින්ගෙන් කලින් අනතුරු ඇඟවීමක් ලැබුන නම් අපට හුඟක් වටිනා ජීවිත බේරගන්න තිබුනා. මට අහන්න ලැබුනා අගමැතිතුමා හෙලිකොප්ටරයෙන් මෙහාට ඇවිල්ල ස්ථාන කීපයක් බලන්න ගියා කියල. ඒත් අප නම් ඔහුව දැක්කෙ නැහැ.''

© www.wsws.org